# ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යාපනවේදී (විශේෂ) උපාධි පාඨමාලාව 2022/2025

ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන අධ්‍යාපනවේදී (විශේෂ) උපාධි පාඨමාලාව (2022/2025) සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

tamilguru.lk

## 1. පාඨමාලාවේ ස්වභාවය

1.1 අධ්‍යාපනවේදී (විශේෂ) උපාධි පාඨමාලාව සම්භාර 120 කින් යුක්තය. ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් සඳහා පමණක් පාඨමාලා සම්භාර 40 ක් නිදහස් කෙරේ.

1.2 සම්මිශ්‍රිත ක්‍රමය අනුව (Blended Learning) මාර්ගගතව හා සම්මුඛ සැසි මගින් පවත්වනු ලබන පාඨමාලාවකි.

1.3 සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පාඨමාලාව පවත්වන අතර ඉංග්‍රීසි විෂය ධාරාව පමණක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

1.4 ශාස්ත්‍රීය විෂය ඛණ්ඩය යටතේ ඔබ විසින් පහත දැක්වෙන විෂය ධාරාවන්ගෙන් එකක් තෝරා ගත යුතු වේ.

| විෂය අංකය | විෂයය ධාරාව | විෂය අංකය | විෂයය ධාරාව |
|---|---|---|---|
| 01 | ප්‍රාථමික | 08 | ගෘහ ආර්ථික විද්‍යාව |
| 02 | ගණිතය | 09 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය |
| 03 | විද්‍යාව | 10 | ශිල්ප කලා |
| 04 | වාණිජ්‍යය | 11 | විශේෂ අධ්‍යාපනය |
| 05 | සමාජීය විද්‍යා | 12 | තොරතුරු තාක්ෂණය |
| 06 | ඉංග්‍රීසි | 13 | දෙවන භාෂාව සිංහල/දෙමළ |
| 07 | කෘෂිකර්මය | 14 | සෞන්දර්ය අධ්‍යාපනය - සංගීතය |

## 2. අයදුම් කිරීම සඳහා ප්‍රවේශ සුදුසුකම්

2.1 අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම හෝ,

2.2 රජයේ ගුරු විද්‍යාල පුහුණු සහතික පත්‍රය හෝ,

2.3 ජාතික අධ්‍යාපන ආයතනයේ දුරස්ථ ගුරු පුහුණු සහතික පත්‍රය හෝ,

2.4 උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ඩිප්ලෝමාව හෝ,

2.5 ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ,

2.6 ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාව පිළිගත් වෙනත් සුදුසුකම්

tamilguru.lk

සහ

2.7 2021.11.01 දිනට හෝ එදිනට පෙර ශ්‍රී ලංකා ගුරු සේවයේ/ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයේ/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථිර පත්වීමක් ලබා තිබීම.

සහ

2.8 ස්ථිර පත්වීම ලබා ගැනීමෙන් අනතුරුව 2021.11.01 දිනය වන විටත් අඛණ්ඩව සේවයේ නිරතව සිටීම.

## 3. ගාස්තු අය කිරීම

| | |
|---|---|
| අයදුම්පත්‍ර ගාස්තුව (ප්‍රවේශ විභාග ගාස්තුව ඇතුළත්ය) | රු: 1,500/= |
| ලියාපදිංචි ගාස්තුව | රු: 2,000/= |
| අධ්‍යාපනවේදී (විශේෂ) උපාධි පාඨමාලා ගාස්තුව | රු: 150,000/= |

පාඨමාලා ගාස්තු සමාන වාරික දෙකකින් ගෙවිය හැකිය. විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේ දී අදාළ විභාග ගාස්තු ගෙවිය යුතුය. ගාස්තු සංශෝධනය කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවට බලය ඇත.

## 4. පාඨමාලාව පැවැත්වෙන මධ්‍යස්ථාන

tamilguru.lk

පාඨමාලාව පැවැත්වෙන මධ්‍යස්ථාන විෂයධාරා අංකය සහ මාධ්‍යය අනුව වෙන් කර පහත දක්වා ඇත. එයින් තමා කැමති මධ්‍යස්ථාන දෙකක් තෝරා ගත හැකිය.
ඒ ඒ විෂයධාරාව පවත්වන මධ්‍යස්ථාන හා ශිෂ්‍ය සංඛ්‍යාව තීරණය කිරීමේ බලය ජාතික අධ්‍යාපන ආයතනය සතුවේ.

| අනු අංකය | මධ්‍යස්ථානය | විෂය ධාරා අංක (වගුව 1.4 බලන්න) | මාධ්‍යය | | |
|---|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| 01 | කොළඹ | 01, 02, 03, 04, 05, 06, 07, 08, 09, 10, 11, 12, 13, 14 | √ | √ | √ |
| 02 | ගම්පහ | 01, 05, | √ | | |
| 03 | කළුතර | 01, 05, | √ | | |
| 04 | මහනුවර | 01, 02, 03, 04, 05, 06, 07, 09 | √ | √ | √ |
| 05 | මාතලේ | 01, 05, | √ | √ | |
| 06 | නුවරඑළිය | 01, 02, 03, 04, 05, 06 | √ | √ | √ |
| 07 | ත්‍රිකුණාමලය | 01, 05, | | √ | |
| 08 | අම්පාර | 01, 05, | √ | √ | |
| 09 | මඩකලපුව | 01, 05, 14 | | √ | |
| 10 | යාපනය | 01, 02, 03, 04, 05, 06 | | √ | √ |
| 11 | මන්නාරම | 01, 05, | | √ | |
| 12 | කිලිනොච්චිය | 01, 05, | | √ | |
| 13 | වවුනියාව | 01, 05 | | √ | |
| 14 | මුලතිව් | 01, 05, | | √ | |
| 15 | අනුරාධපුරය | 01, 05, | √ | | |
| 16 | පොළොන්නරුව | 01, 05, | √ | | |
| 17 | කුරුණෑගල | 01, 05, 06 | √ | | √ |
| 18 | පුත්තලම | 01, 05, | √ | √ | |
| 19 | රත්නපුරය | 01, 05, | √ | √ | |
| 20 | කෑගල්ල | 01, 05, | √ | √ | |
| 21 | ගාල්ල | 01, 05, | √ | | |
| 22 | මාතර | 01, 05, | √ | | |
| 23 | හම්බන්තොට | 01, 05, | √ | | |
| 24 | බදුල්ල | 01, 05, 06 | √ | √ | √ |
| 25 | මොණරාගල | 01, 05, | √ | | |

tamilguru.lk

**5. තෝරා ගැනීම**

පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයක හා සම්මුඛ පරීක්ෂණයක හෝ සම්මුඛ පරීක්ෂණයක පමණක් ප්‍රතිඵල මතය. ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන්නේ නම් එය **''අභියෝගතාව හා අධ්‍යාපනය පිළිබඳ සාමාන්‍ය දැනීම''** සම්බන්ධ පරීක්ෂණයකි. එබඳු අවස්ථාවක ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අයදුම්කරුවන් විසින් ව්‍යාජ ලේඛන හෝ තොරතුරු ඉදිරිපත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

tamilguru.lk

**6. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

6.1 ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් පාඨමාලාවට අයදුම්පත් කැඳවීම සම්බන්ධ තොරතුරු ලබා හැකිය. https://www.exams.nie.lk/intakes/new

6.2 මාර්ගගත ක්‍රමයට අයදුම්පත් යොමු කිරීමේ දී පහත සඳහන් ක්‍රියාපිළිවෙල අනුගමනය කරන්න.

6.2.1 https://www.exams.nie.lk/intakes/new වෙබ් අඩවියට ඇතුළත් වී (Sign up) අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න. එහි දී ඔබට ලැබෙන පරිශීලක අංකය (User ID) සටහන් කර ගන්න. අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මුරපදය (Password) මතක තබා ගන්න.

6.2.2 වෙබ් අඩවියේ දකුණු පස ඉහළ දැක්වෙන කොටු දෙකෙහි පරිශීලක අංකය හා මුරපදය යොදා ඇතුළත් වන්න. (Log in)

6.2.3 ඔබ පිළිබඳ තොරතුරු පත්‍රිකාව (User Profile) යාවත්කාලීන (Update) කරන්න.

- පෞද්ගලික තොරතුරු
- සේවා තොරතුරු
- අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

6.2.4 අනතුරුව නව ප්‍රවේශ (New Enrollment) වෙත පිවිසෙන්න.

6.2.5 ඊළගට ඔබට නියමිත පාඨමාලාවේ අයදුම්පත්‍රයට ප්‍රවේශ වන්න. (My Application)

6.2.6 අයදුම්පත්‍රයේ දක්වා ඇති තොරතුරු නිවැරදි දැයි පරීක්ෂා කරන්න.

6.2.7 එහි අයිතම අංක 06 යටතේ පාඨමාලාව පැවැත්වෙන මධ්‍යස්ථානය මාධ්‍යය හා විෂයධාරාව තෝරා අයදුම්පත්‍රය යොමු කරන්න.

6.2.8 අදියර 2 හි ගෙවීම් (STEP 2 Payment) සඳහා ප්‍රවේශ වන්න. මෙහි දී ඔබ වෙත ලැබෙන ගෙවීම් යොමු අංකය (Payment Reference Number) යොදා දක්වා ඇති ගිණුමට මුදල් ගෙවන්න. (ලංකා බැංකු ශාඛාවකින් මහරගම ශාඛාවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ, අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක 607628 දරණ ගිණුමට අයදුම්පත්‍ර ගාස්තු වශයෙන් රු: 1500/- ක මුදලක් බැර කරන්න.)

6.2.9 මුදල් ගෙවන ලද රිසිට් පත ස්කෑන් කර ගෙවීම් දිනය හා ගණුදෙනු යොමු අංකය (Transaction Reference Number) ඇතුළත් කරන්න.

6.2.10 ඔබට ලැබෙන අයදුම්පත් පරිශීලක අංකය (Application Reference Number) සටහන් කර තබා ගන්න.

6.3 වැඩිදුර විස්තර සඳහා 0117601777/0117601776/0117601755 දුරකථන අංකවලට සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා අමතන්න.

**අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2021.11.25**

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

tamilguru.lk